| ශ්‍රී ලංකාවේ මහජන ආරක්ෂක ආඥාපනත | | | |
|---|---|---|---|
| | **පළමු කොටස - සාමාන්‍ය** | **දෙවන කොටස - හදිසි නීති රෙගුලාසි** (මෙය ක්‍රියාත්මක කළ හැකි වන්නේ **පළමු කොටස යටතේ ප්‍රකාශනයක් නිකුත් කොට ඇති විට පමණි.** | **තෙවන කොටස - ජනාධිපතිවරයාගේ විශේෂ බලතල** (ජනාධිපතිවරයාට **ඕනෑම වෙලාවක** ක්‍රියාත්මක කළ හැකි බලතල - පළමු කොටස යටතේ ප්‍රකාශනයක් නිකුත් කිරීම අත්‍යවශ්‍ය නොවේ) |
| බලතල | මෙමගින් ජනාධිපතිවරයාට දෙවන කොටස ක්‍රියාත්මක කිරීමට බලය ලබා දී ඇත. දෙවන කොටස හරහා හදිසි තත්ත්වයට සම්බන්ධ නීති (හදිසි නීති රෙගුලාසි) සෑදීමට බලය ජනාධිපතිවරයා වෙත ලබා දේ. | 5 වන වගන්තිය - මහජන ආරක්ෂාව සහ මහජන සාමය පවත්වාගෙන යාම සඳහා රෙගුලාසි පැනවීමට **සාමාන්‍ය සහ පුළුල් බලයක්** ජනාධිපතිවරයා වෙත ලබා දේ.<br><br>ජනාධිපතිවරයාට පහත දැක්වෙන දෑ සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීමට හැකි බව එහි විශේෂයෙන් සඳහන් වේ.<br>- පුද්ගලයන් රඳවා තබා ගැනීමට අවසර දීම,<br>- යම් දේපලක හෝ ව්‍යාපාරයක පාලනය තමන් යටතට ගැනීම, ඉඩම් අත්පත් කරගැනීම,<br>- ඇතුළුවීමට සහ සෝදිසි කිරීමට අවසර දීම,<br>- ඕනෑම නීතියක් සංශෝධනය කිරීම හෝ අත්හිටුවීම,<br>- මෙම රෙගුලාසිවලින් බලපෑමට ලක් වූවන්ට වන්දි හෝ ගාස්තු හෝ ගෙවීම සහ<br>- මෙම රෙගුලාසි යටතේ වරදකරුවන් වූවන් ඇල්ලීම සහ ඔවුන්ට දඬුවම් දීම | ආ) යම් තත්ත්වයක් පාලනය කිරීමට පොලිසිය ප්‍රමාණවත් නොවන බව ජනාධිපතිවරයා සිතන්නේ නම් මහජන සාමය පවත්වාගෙන යාම සඳහා හමුදාව කැඳවමින් ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට ජනාධිපතිවරයාට හැකියාව ඇත. මෙමගින් සෝදිසි කිරීම, අත්අඩංගුවට ගැනීම, අවි සහ පුපුරන ද්‍රව්‍ය සන්තක කරගැනීම සහ ඉවත් කිරීම, ඇතුළුවීම සහ පරිශ්‍රයන් හෝ පුද්ගලයින් සෝදිසි කිරීම ආදිය කිරීමට හමුදා සාමාජිකයන්ට බලය ලැබේ.<br><br>ආ) එය අත්‍යවශ්‍ය බව ජනාධිපතිවරයා සිතන්නේ නම් ගැසට් නිවේදනයක් හරහා ඇඳිරි නීතිය පැනවීමට ජනාධිපතිවරයාට හැකිය.<br><br>ඇ) යම් සේවයක් අත්‍යවශ්‍ය සේවයක් යැයි ප්‍රකාශ කිරීම මහජන සුබසිද්ධිය සඳහා අවශ්‍ය යැයි ජනාධිපතිවරයා සිතන්නේ නම් ගැසට් නිවේදනයක් හරහා එසේ කිරීමට ජනාධිපතිවරයාට හැකිය. අත්‍යවශ්‍ය සේවා සේවකයින්ට සේවයට වාර්තා කිරීමෙන් වැළකීමට නොහැකි අතර, අත්‍යවශ්‍ය සේවාවකට ප්‍රචණ්ඩත්වය, ලිඛිත හෝ වාචික ප්‍රකාශ හෝ අපහාස තුළින් බාධා පැමිණවීම වරදක් බවට පත්වේ. |
| වලංගු කාලවකවානුව | ප්‍රකාශනයට පත් කොට දින 30 ක් දක්වා වලංගු වේ.<br><br>කෙසේවුවත්, මෙම ප්‍රකාශනය **වහාම** පාර්ලිමේන්තුව වෙත දැන්විය යුතු අතර එය පාර්ලිමේන්තුවේ සම්මත නොවුණ හොත් දින 14 ක් ඇතුළත කල් ඉකුත් වේ.<br><br>2019 අප්‍රේල් සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරයට ප්‍රතිචාරයක් ලෙස 2019 අප්‍රේල් 22 වන දින මෙම ප්‍රකාශනය ගැසට් නිවේදනයක් ලෙස නිකුත් කෙරිණි.<br>http://www.documents.gov.lk/files/egz/2019/4/2120-03_S.pdf<br>මෙය 2019 අප්‍රේල් 24 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කෙරිණි. | පළමු කොටස යටතේ පැනවූ ප්‍රකාශනය වලංගු වන තාක්.<br><br>2019 අප්‍රේල් 22 වන දින හදිසි නීති රෙගුලාසි ගැසට් කරන ලද අතර (http://documents.gov.lk/files/egz/2019/4/2120-05_S.pdf) නිවැරදි කිරීම් කිහිපයක් ගැසට් නිවේදන දෙකක් ලෙස අප්‍රේල් 24 වන දින පළ කෙරිණි. | ඉහත සියලුම නියෝග මාසයක් දක්වා වලංගු වන අතර ඒවා දිගු කිරීමට අවශ්‍ය නම් නැවත ගැසට් කළ යුතු වේ. වෙනත් ගැසට් නිවේදනයක් මගින් ජනාධිපතිවරයාට හෝ පාර්ලිමේන්තුවට හෝ ඒවා ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකිය.<br><br>ශ්‍රී ලංකාව පුරාවටම (දිස්ත්‍රික්ක 25ටම) හමුදාව කැඳවමින් ප්‍රකාශන නිරතුරුවම (සෑම මසකම) නිකුත් කර ඇති අතර වඩාත්ම ආසන්න ප්‍රකාශනය 2022 මාර්තු 21 වන දින ගැසට් කොට ඇත.<br>http://www.documents.gov.lk/files/egz/2022/3/2272-10_S.pdf |

***නීතිඥ එර්මිසා ටෙගාල් විසින් 2022 අප්‍රේල් 2 වන දින සකසන ලදි. ප්‍රතිපෝෂණ ඇත්නම්, ermiza@gmail.com වෙත ලියන්න.***
***ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය නිශාදි ගුණතිලක විසිනි.***